# ජනසවි සංවර්ධන සංකල්පය

**පසුබිම**

ලක්දිව මෑත කාලීන ආර්ථික පිළිවෙත් මූලික වශයෙන් යොමු වූයේ ජනතාව ගේ ජීවනතත්වය සුභසාධන වැඩ සටහන් මගින් ප්‍රමාණවත් මට්ටමක පවත්වාගෙන යාමට ය. රජයේ ආයෝජනවලින් විශාල ප්‍රමාණයක් එම කාර්යය සඳහා යොදවන ලදී. ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ආයෝජනයන්ට මෙය බාධකයක් විය. කල්යත් ම රටේ වැඩිවන ජනගහනයට අනුරූපව සුභ සාධන කටයුතු ද පුළුල් කිරීමට සිදු වූ නිසා වැඩි ජාතික ධනයක් සුභ සාධනයට වැය කිරීමට රජයට සිදුවිය. නිදහස ලැබූ පසු දශක තුනක් පමණ වූ කාලයක් තුළ වසරකට 3%–4% දක්වා වූ ද.ජ.නි. වර්ධන වේගයක් අනුව ඇතිවුන ආර්ථික ප්‍රගතිය සුළු වූ නිසා සුභ සාධන අවශ්‍යතා සඳහා වැඩි වන වැය, ආර්ථිකයට දැරිය නොහැකි තත්වයකට පත් විය. එහෙයින් වැඩිවන ජනතාව ගේ මූලික අවශ්‍යතා වන ආහාර හා රැකියා අවශ්‍ය මට්ටමට ලබාදීම මෙම දුර්වල ආර්ථිකයට ඉතා අපහසු කටයුත්තක් වූයෙන් 1960 සිට බලයට පත් වූ රජයයන් කෙතෙක් ප්‍රයත්න දැරුවද පෙර පැවැති සුභ සාධන මට්ටම එලෙසම පවත්වා ගෙන යාමට නොහැකි විය. එහි ප්‍රතිඵලයක් වූයේ රටේ දිළිඳු භාවය ක්‍රමයෙන් වැඩි වෙමින් පැවතීම යි.

මෙම තත්ත්වය කඩිනම් ලෙස වෙනස් කිරීමේ අරමුණින් 1977 දී බලයට පත් රජය නව ආර්ථික ප්‍රතිපත්ති මාලාවකට රට යොමු කර විය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුළින් එතෙක් පැවැති සම්ප්‍රදායික ආයෝජන ක්‍රම වලට නව ආයෝජන එක් කරවීම හා නොයෙක් නව ආර්ථික ක්‍රම පිළිවෙත් මගින් සීඝ්‍ර ආර්ථික වර්ධනයකට රට යොමු කරවීම එහි අරමුණු විය.

මෙම සීඝ්‍ර වර්ධනය තුළින් පැන නගින ආර්ථික සශ්‍රිකත්වය සමාජයේ ඉහළ කොටස් වල සිට පහළ ජන කොටස් දක්වා බේදී යනු ඇතැයි නව ප්‍රතිපත්ති සම්පාදකයෝ බලාපොරොත්තුව වූහ. එමගින්, එතෙක් උග්‍ර ප්‍රශ්නයක්ව පැවැති දිළිඳු භාවය ක්‍රමයෙන් අඩු වේ යැයි ද ඔවුහු අපේක්ෂා කළහ. එහෙත් එම නව ආර්ථික ක්‍රියාදාමයෙන් ගොඩ නැගුණු ප්‍රතිලාභ විශාල පරිමාණ ධන ආයෝජන හා බැදී පැවතුන නොයෙක් අකාර්යක්ෂමතාවයන් හා නාස්ති නිසාද, කල්යත්ම පහළ ආදායම් ලබන පිරිස් වලට මනාලෙස ඵලප්‍රයෝජන බෙදී යෑම දුර්වල විය. එතෙක් පහළ ආදායම් ලබන ජන කොටස් තුළ තිබූ දුගී භාවය තවත් උත්සන්න වී ඇති බව වර්තමාන ජනගහනයෙන්


ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂිකර්ම සැළසුම් හා අගැයීම් අංශයේ ප්‍රධාන

**ආචාර්ය
රංජිත් දි. වනිගරත්න
විසිනි.**


අඩකට වැඩි ප්‍රමාණයක් දිළිඳු මට්ටමට පහළ සිටීමෙන් පැහැදිලි වේ. මෙම පසුබිම අනුව බලන කල අඩු ආදායම් ලබන ජනතාවගේ දිළිඳු භාවය තුරන් කිරිමේ අරමුණින් ආරම්භ කර ඇති ''ජනසවිය'' පෙර තිබූ ආර්ථික හා සුභ සාධන පිළිවෙත් වලින් පරිබාහිර නව සංකල්පයක් ලෙස සැළකිය හැකි ය.

**ජනසවි ආයෝජන හා බලාපොරොත්තු**

රජය බලාපොරෙත්තු වන ආර්ථික වර්ධන සීඝ්‍රතාව ඇති කිරීමට අවශ්‍ය මූලික අතදීම ජනසවිය තුළින් කිහිප ආකාරයකින් සිදුකෙරේ.

(අ) පරිභෝජන ආධාරකයක් මගින් දැනට දිළිඳු තත්ත්වයක ජීවත්වන ජනගහනයෙන් අඩකට වැඩි ප්‍රමාණයකගේ ආහාර ද්‍රව්‍ය පරිභෝජන තත්ත්වය උසස් කිරීමට සවියක් ලබා දෙයි. මසකට රු. 1458ක වටිනාකමකට සරිලන ප්‍රමාණයක ආහාර ද්‍රව්‍ය ලබාගත හැකි ''ජනසවි පත'' නමින් හැඳින්වෙන කූපන්පත් විශේෂයක් මගින් මෙය සිදුකෙරේ. පෙර තිබූ ආහාර මුද්දර ක්‍රමයට වඩා තුන් හතර ගුණයකින් දිළිඳු ජන කොටස් වල පෝෂණ තත්ත්වය සවිවීමක් එමගින් අපේක්ෂා කෙරේ.

දිළිඳු පවුල් ලබන වෙනත් සුළු ආදායම් ද, ''ජනසවිපත'' තුළින් ලබා ගන්නා අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන ඉතිරි වන මුදල ද, සිය ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා වෙනත් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට යෙදවිය හැක. දිළිඳු තත්ත්වයක දැනට ජීවත් වන විශාල සංඛ්‍යාත ජන කොටස් තුළ භාණ්ඩ හා සේවා පිළිබඳ ඵලදායි ඉල්ලුම පුළුල් හා වැඩි කිරීමක් මෙයින් සිදු කෙරේ.

(ආ) ජනසවිය මගින් තෝරා ගත් සෑම දිළිඳු පවුලකට ම මසකට රු. 1048 පමණ වූ ඉතිරි කිරීම් ආධාරක මුදලක් පවුලේ නමින් බැංකුවක තැන්පත් කරනු ලැබේ. එමගින් සෑම පවුලකටම අවම වශයෙන් රු. 25,000 ක් වූ මූලික බැංකු තැන්පතුවක් අවුරුදු දෙකක කාලයක් තුළ දී එකතු වේ. දිළිඳු මට්ටමේ පවතින පවුලකට පුළුල් ලෙස ධනය වැඩි කර ගැනීමේ ආයෝජන මගකට එළඹිය හැකි මූලික මුදලක් එමගින් ලබා දෙයි. මෙම තැන්පතුවට රු. 1458 ක් වූ පාරිභෝජන ආධාරකයෙන් ඉතිරි කරගත හැකි යම් මුදල් ප්‍රතිශතයක් ද, නොයෙක් දෛනික ආර්ථික කටයුතු වලින් ලැබෙන මුදල් ද, එක් කිරීමට අවකාශ ලැබේ. එමගින් දැනට දිළිඳු තත්ත්වයේ ඇති පවුලකට සිය ආර්ථික ආයෝජනයන් දියුණු කරගත හැකි මූලික ප්‍රාග්ධන ප්‍රමාණය පුළුල් කර ගත හැක.

(ඇ) ජනසවිය තුළින් ඉදිරිපත් කරණ ඉහතකී ඉතිරි කිරීමේ ආධාරකය තුළින් දැනට ලක්දිව සිටින 14,42,000 පමණ දිළිඳු පවුල් සංඛ්‍යාව තුළ රුපියල් බිලියන තිස්හයදහසක (රු. 36,000,000,000) 'විභව' ප්‍රාග්ධනයක් ගොඩ නැගේ. මේ සුවිසාල ධනස් කන්ධය නිසිපරිදි ආර්ථික ආයෝජනයන් කෙරෙහි යොමු කිරීමෙන් රට තුළ රක්ෂා හා ආදායම් සීඝ්‍රයෙන් ගොඩ නැගිය හැකි ආර්ථිකයක් ඉතා කෙටි කාලයක් තුළ දියත් කිරීම අපේක්ෂා කෙරේ.

(ඇ) ජනසවිය පරමාර්ථ අනුව මෙම විභව ධන සම්භාරය ගොඩනැගනුයේ අවුරුදු දෙකක කාලයක් තුළයා එමනිසා ඒ කෙටි කාලය ?ළ එම ධනය

යෙදවීමට සුදුසු කාර්මාන්ත හා වෙනත් ආයෝජන මාර්ග, අලෙවි කිරීමේ මාර්ග හා වෙනත් මූලික අවශ්‍යතා හඳුනා ගත යුතුව ඇත. මෙම ආයෝජන මාර්ග හඳුනා ගැනීම හා සම්බන්ධ බලාපොරොත්තු කිහිපයක්ද ඇත.

එනම්, (1) එම ආයෝජන මත ගොඩ නැගෙන කෘෂිකර්ම. සේවා සහ කර්මාන්ත හඳුනා ගැනීම කළ යුත්තේ පවුල හා ගම මට්ටමේ එමගින් ප්‍රතිලාභ ලැබිය යුතු (විශේෂයෙන් ඉතා දිළිඳු) ජන කොටස් තුළින් මය. මෙසේ කිරීමට අවශ්‍යවන උපදෙස්, සැලසුම් හා වෙනත් ආධාර ලබාදීම හා ලබා ගැනීම සඳහා නව සංවිධාන ගම් මට්ටමේ හා ඉන් ඉහළ තලයන්හි ගොඩ නගනු ඇත.

(2) එම පවුල් හා ගම් මට්ටමේ පවතින පහසුවෙන් උපයෝගී කරගත හැකි සම්පත් මත වැඩි ඵලදායිතාවයක් ඇති, මිනිස් ශ්‍රමය බහුලව උපයෝගී කරගත හැකි අඩු වියදමකින් ලබාගත හැකි තාක්ෂණයක් ද අපේක්ෂා කෙරේ. දීර්ඝ කාලීන වශයෙන් ප්‍රධානතම අවශ්‍යතාවන් වනුයේ පරිසර හා සම්පත් සුරකෙන තාක්ෂණයකි.

(3) කර්මාන්ත හා වෙනත් ආයෝජන ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් හා සහයෝගය ගම් මට්ටමේ ක්‍රියා කරණ රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් හා ආයතන මගින් සිදු කෙරේ.

(4) එමගින් ජනසවිය බලාපොරොත්තු වන්නේ මිනිස් ශ්‍රමය හා දක්ෂතාවයන් වැඩියෙන් උපයෝගි කරගත හැකි නොයෙක් සුළු කර්මාන්ත ගම් මට්ටමේ බහුල කිරීමය. දීර්ඝ කාලීන වශයෙන් කෘෂිකාර්මික හා ඉන් පරිබාහිර, අමු ද්‍රව්‍ය මත ගොඩ නැගෙන, නිෂ්පාදන කර්මාන්ත පදනමක් ගම හා ප්‍රාදේශීය මට්ටම්වල ආරම්භ කිරීම එමගින් අපේක්ෂා කෙරේ.

එවැනි පදනමක් මත රට තුළ රක්ෂා හා ආදායම් මාර්ග නිරන්තරයෙන් වැඩිවන අතර කෘෂිකර්ම, සේවා හා නිෂ්පාදන කර්මාන්ත වර්ධනයේ සමබරතාවක්ද දැඩි අන්තර් සම්බන්ධතාවයක්ද දීර්ඝකාලීන වශයෙන් බලාපොරොත්තු විය හැකිය.

මේ සියල්ල තුළින් ජනසවියේ පුළුල් බලාපොරොත්තුව වන්නේ පවුල් මට්ටමේ සිට ඉහළට ජාතික මට්ටම දක්වා විහිදෙන සංවර්ධන පද්ධතියක් ගොඩනැගීමයි.

**සංකල්පමය නිගමන**

යටත් විජිතවාදී පසුබිමක් ඇති රටක් වශයෙන් නිදහස ලැබූ පසුවත් ලංකාවේ ආර්ථික හා සමාජීය ගැටළු විසඳීමට මෙතෙක් ඉදිරිපත් කරන ලද සංවර්ධන ආකෘති සියල්ල ම පාහේ බටහිර රටවලින් ආරම්භ වූ සංවර්ධන න්‍යායන් සහ සංවර්ධන ''ආධාර'' ලබා දෙන අන්තර් ජාතික සංවිධානවල අදහස් හා කොන්දේසි අනුව ගොඩනැගී ඇති බව පැහැදිලිව පෙනේ. එම සංවර්ධන ආකෘති රටෙහි පැවැති ආර්ථික හා සමාජ රටාවන් හා අවශ්‍යතාවන්ට අනුරූපව ප්‍රතිසංස්කරණය නොකොට අන්ධානුකරණයෙන් එලෙසම ක්‍රියාත්මක කිරීමට පාලකයින් යුහුසුළු වූ බව ද පැහැදිළිය. රටෙහි ආර්ථිකයට දිගු කාලීන වශයෙන් ඉසිලිය නොහැකි විශාල ආයෝජනයන් මත ගොඩනැගුණ මහා පරිමාණ කෘෂිකර්ම හා කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීම මෙම අන්ධානුකරණ ක්‍රියා වලියේ එක් ලක්ෂණයකි.

පසුගිය දශක යතරක් තුළ මෙවැනි ආකෘති මත ගොඩ නඟන ලද සැළසුම් හා ආයෝජන නිසා ලැබූ විශේෂ ප්‍රගතියක් නොපෙනේ. සැළකිය යුතු අන්දමකට නිෂ්පාදන කර්මාන්ත හා සේවා අඩිතාලමක් බිහිවී ද නැත. ග්‍රාමීය කෘෂිකර්ම අංශයේ ක්‍රමයෙන් කුඩාවන වගා භූමි ඒකක හා එහි වගා කරුවන් ගේ දුර්වල වන ආර්ථිකය පන ගැන්වීමට සමත් වූ කෘෂි විවිධාංගීකරණයක්ද බිහිවී නැත. බොහෝ දුරට වී ගොවිතැනට හුරු වූ ක්‍රමයෙන් ආදායම් තත්ත්වයන් හීන වෙමින් පවතින ගොවිපල් ආර්ථිකයකි, අද රට තුළ ඇත්තේ. රටෙහි ආර්ථිකය අදත් රැඳී ඇත්තේ යටත් විජිත සමයේ ආරම්භ කරන ලද වැවිලි කර්මාන්ත මත ය. මෙම තත්ත්වය යටතේ රැකියා හා ඉඩම් විරහිත භාවය, අඩු ආදායම්, ඌණ පෝෂිත භාවය හා එක්ව ඇති දිළිඳුබව, උත්සන්න අවස්ථාවකට එලඹෙමින් පවතී.

පෙර පිළිගත් සංවර්ධන ආකෘති මත ගොඩනැගුණු ආර්ථික වර්ධන හා සුභ සාධන සැලසුම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වූයේ ඉහල තැන්වල මධ්‍යගත තීරණ හා පාලන වැඩ පිළිවෙලවල් අනුව ය. එමගින් එකිනෙකින් වෙන් වූ සංවර්ධන පරමාර්ථ, ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් හා ව්‍යාකූල වූ පරිපාලන පද්ධති රටතුළ බිහි විය. එකිනෙකට වෙනස් වූ දෘෂ්ටි කෝණ වලින් සංවර්ධනය දෙස බැලීම හා ඒ අයුරින්ම ක්‍රියාත්මක වැඩ පිළිවෙලවල් ඇති කිරීම නිසා සංවර්ධන ක්‍රියා දාමයේ එකමුතු බවක්ද ඇති නොවීය. මෙහි ප්‍රතිඵලය වූයේ අසාර්යක්ෂමතා හා ඌණ සංවර්ධනය බිහිකරණ උල්පත් ජාතික සංවර්ධන ක්‍රියාදාමය තුළ බහුල වීම ය.

ඉහත කී තත්ත්වයට ඉඳුරා ම වෙනස් ආකෘතියක් ජනසවිය මගින් ඉදිරිපත් කරයි. ජනසවි ආකෘතියට විශේෂිතව දර්ශනයක් ඇත. එනම්, බහු දෘෂ්ටි කෝණයකින් (holistic) සංවර්ධනය දෙස බැලීමයි. ආර්ථික හා සමාජීය වශයෙන් දුර්වල තත්ත්වයක පවත්නා ජන කොටස් වල හැකියා හා අපේක්ෂා මත ගොඩ නගන ලද ක්‍රියාදාමයන් තුළින් රටෙහි ආර්ථික සංවර්ධනය දෙස බැලීම ජනසවියේ සුවිශේෂ ලක්ෂණයකි. මෙමගින් ඇති වන ප්‍රධාන ප්‍රතිඵලය වන්නේ සංවර්ධන සැළසුම් පිළිබඳ තීරණ ගැනීම, ක්‍රියාත්මක කිරීම, පාලනය හා එයින් ඇතිවන වාසි/අවාසි ලබා ගැනීම හා ඒ සම්බන්ධ වගකීම් පවුල් හා ගම් මට්ටමට විමධ්‍යගත වීමයි.

ජනසවිය මගින් දියත් කරන ආර්ථික සැලසුම මගින් කෙටි කාලීන වශයෙන් අඩු වර්ධන වේගයක් සමඟ වැඩි සහ පුළුල් වූ ප්‍රතිලාභ බෙදීයාමේ ලක්ෂණයක් ඇති වේ. මෙම ප්‍රතිලාභ බෙදීයන්නේ කෘෂිකර්ම, සේවා සහ කර්මාන්ත ක්ෂේත්‍රයන් ගොඩ නැඟීමට ඉවහල් වන තාක්ෂණය මගින් ශ්‍රම භාවිතය වැඩි වශයෙන් යෙදවීමෙන්ය. ජනසවිය මගින් මුලින් බලාපොරොත්තු වන කුඩා කර්මාන්ත තුළින් කෙටි කාලීන වශයෙන් වැඩි ලාභදායි විදේශ වෙළඳ පලවල් ලබාගැනීම අපහසුය. එහෙත් දීර්ඝ කාලීන වශයෙන් එම ක්ෂේත්‍රයන්හි ආයෝජනය පුළුල් හා රාශිගත ආකාරයකට එක් කිරීමෙන් දියුණු තත්ත්වයක පවතින අන්තර් සම්බන්ධතා, නව වෙළඳ පොළවල් හා වැඩි මිල භාණ්ඩ නිෂ්පාදනය රට පුරා පැතිරෙනු ඇත.

ජනසවි ආකෘතියේ එක් සංකල්පමය විශේෂත්වයක් ඇත. එනම් අන්‍යෝන්‍ය සහයෝගය, සීමිත සම්පත් පුළුල් ලෙස බෙදා හැරීම හා සහභාගිත්වයෙන් පොදු තීරණ ගැනීම ආදි පවුල් හා ගම් මට්ටමේ පවතින පාරම්පරික සමාජ ආර්ථික ලක්ෂණ, නූතන වෙළඳ පොල ආශ්‍රිත නිෂ්පාදනය තුළින් ගොඩනැගෙන පුද්ගල දක්ෂතාවයන් හා පුද්ගලිකත්වය, ආර්ථික ලාභ, අතිරික්ත නිෂ්පාදන ආදී ලක්ෂණ හා එකතුකිරීමක් තුළින් ගොඩ නැගීමට බලාපොරොත්තු වන සීඝ්‍ර, ව්‍යාප්ත වූ, කල් පවතින ආර්ථික හා සමාජ සංවර්ධනයකි.

දිගු කලක් බටහිර ආකෘති අනුව දියත් කරන ලද සංවර්ධන ක්‍රියාදාමය තුළින් නැවත දේශීය අවශ්‍යතාව යන්, සම්පත්, තාක්ෂණය හා දක්ෂකම් මනාලෙස උප යෝගී කරගත්, රටටම ආවේනික වූ. සමාජ හා සංසකෘතික පදනමක් මත ගොඩනගන සංවර්ධනයක් ලක්දිව ඇති කිරීම ජන සවියේ ප්‍රධාන අභිප්‍රායකි.

බාධක

ජනසවිය චින්තනය, සංකල්පය, හා එයින් ගොඩනැගී ඇති ආකෘතිය ක්‍රියාත්මක වැඩ පිළිවෙලකට පරිවර්තනය කිරීමේදී ඇති විය හැකි ගැටළු බොහෝය. ප්‍රධානතම ගැටළුවක් වන්නේ ශත වර්ෂ දෙකකට ආසන්න කාලයක් යටත් විජිත වාදය තුළින් ගොඩ නැගුණු, එහි මුල් බැසගත්, සමාජ, ආර්ථික , සංස්කෘතික හා සිතුම් පැතුම් පද්ධතියක් ඉතා සුළු කලක දී ( උදා වසර 5 ක් හෝ 10 ක් තුළ) වෙනස් කළ හැකිද යන්නය.

දැනට ඉදිරිපත් කර ඇති ජනසවි සැලැස්ම අනුව පෙනියන්නේ ගොවි කටයුතු ව්‍යුහය[1] වෙනස් කිරීමක් නොමැතිව පරිභෝජන, ඉතිරිකිරීම් හා ආයෝජන ආධාරක සැපයීමක් තුළින් රටතුළ ආර්ථික සංවර්ධනයක් දියත් කිරීමේ බලාපොරොත්තුවකි. මෙතෙක් ''දුගී දුප්පතුන්ගේ'' නාමයෙන් උසස් බලාපොරොත්තු සහිතව ඉදිරිපත් කරන ලද මෙවැනි සැලසුම් බොහොමයක් ද අවසන් වශයෙන් අයාර්ථක වූයේ ද ගොවි කටයුතු ව්‍යුහයේ තිබූ විශමතා බිඳීමට නුපුළුවන් වූ නිසාය. ගම් මට්ටමේ හුදකලා පවුල් හා සමහර ජන කොටස් තුළ ධනය හා බලය ඒකරාශී වීම නිසා එම සැලසුම් දියත් කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ වලින් විශාල කොට සක් එම ජන කොටස් වෙතට ඇදී ගියේ ය. මේ නිසා දුගී දුප්පත් ජන කොටස්වල තත්ත්වය පෙරටත් වඩා හීන විය.

**මෙම පසුබිම අනුව බලන කළ අඩු ආදයම් ලබන ජනතාවගේ දිළිඳු භාවය තුරන් කිරීමේ අරමුණින් ආරම්භකර ඇති ''ජනසවිය'' පෙර තිබූ ආර්ථික හා සුභසාධන පිළිවෙත් වලින් පරිබාහිර නව සංකල්පයක් ලෙස සැළකිය හැකි ය.**

ව්‍යුහික වෙනස්කම් සිදුකිරීමේ පර මාර්ථයෙන් හා දුප්පතුන්ගේ නාමයෙන් ඉදිරිපත් කළ කුඹුරු පනත හා ඉඩම් ප්‍රතිසංස්කරණ පනත වැනි පරිශ්‍රම ද ක්‍රියාත්මක කිරීමේ දී පෙර කී ව්‍යුහික විශමතාවයන්ගේ බලපෑම නිසා දුප්පත් ජනකොටස් වලට බලාපොරොත්තු වූ පරිදි සෙතක් ඇති කිරීමට නුපුළුවන් විය. නොයෙක් වාර්තා අනුව ජනපද ඉඩම් බෙදීම, ආහාර මුද්දර බෙදා දීම් වැනි මහඟු කර්තව්‍යයන් දියත් කිරීමේදී ද එවැනිම ප්‍රශ්ණ වලට මුහුණ පාන්නට සිදුවී ඇති බවද සැලවේ. කරුණු මෙසේ හෙයින් ජනසවි පරමාර්ථ යන් නිසි ලෙය ඉෂ්ට කිරීමට නම් ඒ හා සමගම සූක්ෂම වූද, පුළුල් වූද, බලපෑමක් ඇති කළ හැකි වූද, කල් පවතින ව්‍යුහික වෙනස් කමක් ගොවි ආර්ථිකයේ හා ඉඩම් භුක්තියේ ඒ හා සමගම ඇති කළ යුතුය.

ගොවි ආර්ථිකයේ දුගී දුප්පත්කම අත්වැල් ගෙන ඇත්තේ ක්‍රමයෙන් ක්ෂුද්‍ර තත්ත්වයකට කැබලි වී යන වගා ඉඩම් පසුබිමක් සමගිනි. උදාහරණ වශයෙන්, 1946 දී ඒක පුද්ගල කෘෂි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.24 වූ අතර එය 1982 වන විට හෙක්ටයාර් 0.14 දක්වා පහත වැටී ඇත. 1962 දී කෘෂිකාර්මික කුඩා ඉඩම් (හෙක්ටයාර් 20 ට අඩු) ප්‍රමාණයෙන් 85% ක්ම හෙක්ටයාර් 2 ට (අක්කර5ට) අඩු විය. 1982 වන විට එම ප්‍රතිශතය 91% දක්වා වැඩිව තිබිණ. 1962 දී කෘෂි කාර්මික කුඩා ඉඩම් වලින් 20% ක්ද, කුඹුරු ඉඩම් වලින් 13% ක්ද, හෙක්ටයාර් 0.2 ට (අක්කර 1/2ට ) අඩුවිය. 1982 වන විට හෙක්ටයාර් 0.2 අක්කර ට අඩු කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය 25 % ක් වූ අතර කුඹුරු ඉඩම් ප්‍රමාණය 20 % දක්වා වැඩිව පැවතිනි. මෙයින් පෙනීයන්නේ වගා ඉඩම්, විශේෂයෙන් කුඹුරු ඉඩම්, ක්‍රමයෙන් ක්ෂුද්‍ර තත්ත්වයකට කැබලි වීගෙන යන බවය. ක්ෂුද්‍ර කැබලි තුළ වියදමට සරිලන ඵලදාවක් හා ආදායමක් ලබා දීමට පෙර රජයයන් විසින් කරන ලද පරිශ්‍රමයන් මුහුණ පෑ සුවිශාල ගැටළු හා ආයෝජන නාස්තිය ජනසවිය ද මුහුණ පෑමට සිදුවනු ඇත.

පෙර ආයෝජනයන් සිදු කරන ලද්දේ එම ක්ෂුද්‍ර ඉඩම් කැබලි හා වගා කරුවන් හුදකලා ඒකක ලෙස ගෙන නොයෙක් සේවා එම ඒකක වෙත යොමු කිරීමෙනි. එයින් නිසි ඵල නෙලා ගැනීමට එම හුදකලා වගා කරුවන්ට බැරිවූයේ එවැනි ඒකක තුළ ඇති ආර්ථික තත්ත්වය ඉතා පහල මට්ටමක තිබීම හා කෘෂි යෙදවුම් ලබා ගැනීමේ දී හා අස්වැන්න අලෙවියේ දී වාසිදායක තරඟකාරී සාමූහික ඉල්ලුමක් ගොඩ නැගීමට බැරි වූ නිසාය. මේ නිසා කෘෂි ද්‍රව්‍ය මිල නියම කිරීම හුදෙක් ම අතරමැදියන් විසින් පාලනය කරන ලදි. වැඩිවෙන නිෂ්පාදන වියදම් සමග කෘෂි නිෂ්පාදන ද්‍රව්‍යය අලෙවි මිල ඒකාකාර හෝ ඇඩි විචල්‍ය බවකටද ගොදුරු විය. මෙයින් වැඩි පාඩු විඳින්නට සිදුවූයේ කුඩා හා ක්ෂුද්‍ර ඉඩම් කැබලි වගා කරුවන්ටයි.

මේ අනුව බලන කල ජනසවිය මගින් ගොවි ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය දියුණු කිරීමට දරණ පරිශ්‍රම යේදී පොදු නිෂ්පාදන හා අලෙවියක්

[1] ගොවි කටයුතු ව්‍යුහය වශයෙන් හඳුන්වනුයේ ඉඩම් හා එහි භුක්තිය මත ගොවි සමාජයේ පුද්ගලයන් හා ජන කොටස් තුළ රැඳී පවතින සමාජ, ආර්ථික හා ආයතනික සම්බන්ධතාවයන්ය.

සඳහා ජනයා සංවිධානය කිරීමට මුල්තැනක් දිය යුතුය. දුගී දුප්පත් ජනයා හුදකලා ඒකක ලෙස සංවිධානය කිරීමට යොමු වුවහොත් ජන සවියටත් සිදුවන්නේ පෙර ඉදිරිපත් කරන ලද ''ඉතා වැඩදායක'' සැලැස්මවලට මුහුණ පාන්නට වූ ගැටළු වලටමය.

ජනසවි ආයෝජනයන් නිසා රටතුළ ආහාර ද්‍රව්‍ය සහ වෙනත් පාරිභෝගික භාණ්ඩවලට ඇති ඉල්ලුම පුළුල්වීමක් අපේක්ෂා කෙරේ. මෙම ඉල්ලුමට සරිලන කුඩා කර්මාන්ත හා ආයෝගික ගොඩ නැගීමට ජනසවිය ඉතිරි කිරීමේ ආධාරකයක් සපයයි. එනමුත් විවෘත ආර්ථික පසුබිමක් මත සිදු කරන මෙම පරිශ්‍රමයේ දී දැනට එවැනි භාණ්ඩ සැප යිමේ යෙදී සිටින විශාල ව්‍යාපාරිකයන් වැඩිවන ඉල්ලුමට සකස් වනසේ සිය කාර්යයන් පුළුල් කිරීම වැළැක්විය නොහැක. එසේ වුවහොත් දැනට වඩා සැපයීමේ ඒකාධිකාරයක් රටතුළ බිහිවීම අනිවාර්යයෙන්ම සිදුවිය හැකි අතර ජනසවි ආධාරලාභීන් ආශ්‍රිතව ගොඩ නැගෙන කුඩා කර්මාන්ත අස රණ තත්ත්වයකට ද වැටෙනු ඇත. අනාගතයේ දී ඇතිවිය හැකි මෙවැනි ප්‍රශ්න ගැන සඪිනමින් පිළියම් සකස් කළ යුතු වෙයි.

දුර්වල තත්ත්වයක පවතින ග්‍රාමීය ආර්ථික පදනමක් යටතේ භාණ්ඩ හා සේවා පිළිබඳ ඇති ඵලදායි ඉල්ලුම පුළුල් කර්මාන්ත කරණයකට ප්‍රමාණ වත් නැත. මෙවැනි ඉල්ලුමක් ගොඩ නැගී ඇත්තේ ද පවුල් 14 ලක්ෂයක් පමණ වූ ග්‍රාමීය වෙළඳ පොලක් මතය. මෙයිනුදු අඩකට වැඩි ප්‍රමාණයක් (පවුල් ලක්ෂ 8 ක් පමණ) දුගී මට්ටමට පහළින් ජීවත් වෙති. එම මට්ටමට ඉහළින් ඇති ජන සංඛ්‍යාව තුළ සැළකිය යුතු කොටසක් ද, එදිනෙදා ජීව නෝපායක් මත යැපෙන දුප්පත් ගොවි පවුල් ලෙසට සැලකිය හැක.

මෙවැනි ජනකොටසක නිරන්තර යෙන් ම පවතින මුදල් හිඟතාවයකට අනුකූලව ගොඩනැගී ඇති භාණ්ඩ පිළිබඳ ඉල්ලුම පුළුල් කර්මාන්ත කාරණයකට බාධා පමුණුවන ලක්ෂණ දක්වයි. උදාහරණ වශයෙන් මෙම ජන කොටස් තුළ වැඩි වාණිජමය හා නිෂ් පාදන පදනමක් ගොඩනැගිය හැකි ''කල් නොපවතින'' පාරිභෝගික භාණ්ඩ පිළිබඳව ඉල්ලුම එතරම් විශාල නොවේ. එය ඒකාකාරී බවක් ද දක්වයි. දැඩි අහඟිහකට මධ්‍යයේ පෙරකී භාණ්ඩ ගැනීමට පෙළඹීමට වඩා අඩු මිලට ගතහැකි ''කල්පවතින'' පාරි භෝගික භාණ්ඩ ලබා ගැනීමට ඔවුන් පෙළඹෙන බැව් පෙනී යයි. එහෙත් මෙවැනි භාණ්ඩවල සවභාවය නිසා ඒ පිළිබඳ ඉල්ලුම දීර්ඝ කාලීනව ප්‍රවර්ධන යක් නොවන ස්වභාවයක් දක්වයි.

ග්‍රාමීය ජන කොටස තුළ ඵලදායි ඉලලුමේ ප්‍රමාණවත් බවක් නොමැති නිසා ද විශාල වෙළඳ පොලක් රටතුළ නොමැතිකම නිසා ද මෙම කල් පවතින පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය පුළුල් කිරීමට රටතුළින් රුකුලක් නැත. මෙම කරුණුම කල් නොපවතින භාණ්ඩ දැනට වඩා රටතුළ බහුල කරවීමටත් බාධා පමුණුවයි. මේ නිසා ලක්දිව භාණ්ඩ නිෂ්පාදනය හුදෙක් ම විදේශ වෙළඳ පොලවල් දෙසට වැඩියෙන් යොමු කළ යුතුව ඇත. මෙයින් වානිජ හා සේවා දියුණුවට අවශ්‍ය මූලික අඩිතාලම වූ ජනතාව ගේ ආදායම් දියුණු කිරීමක් ඇති කර ගත හැක.

මේ සමගම පැන නගින තවත් ප්‍රධාන පෙලේ ප්‍රශ්නයක් වනුයේ යටත් විජිත බැම්මෙන් මිදුණු, මහජනයා සහභාගි කරවන, විශේෂ සංවර්ධනයක් කරා ගමන් කිරීමට හැකි විපරිතකරණයක් රටතුල ඇති කිරීමට අවශ්‍ය සවුල අධිෂ් ඨානයක් හා කැපවීමක්, වර්තමාන දේශ පාලනික හා පරිපාලනික පද්ධති තුළ දීර්ඝකාලීන වශයෙන් පවත්වා ගෙන යාහැකිද යන්නය. ජනසවි ආකෘතිය ක්‍රියාකාරී වැඩ පිලිවෙලකට පරිවර්තනය කිරීමේදී නිදහස ලැබීමට පෙර යටත් විජිත යුගයේ පැවැති වැඩි ඵලදායි ගුණාංග (උදා: පරිපාලන ක්ෂේත්‍රයේ විනය ගරුක බව, .කාර්යක්ෂමතාවය) නැවත ඉදිරිපත් කිරීමක් බලාපොරොත්තු වේ. තවත් සමහර අංශවල (උදා: සමාජ-සංස්කෘතික ක්ෂේත්‍රයේ) යටත් විජිත යුගයටත් පෙර ඉතිහාසයේ බහු ලව තිබියයි සැලකෙන සමාජ සාරධර්ම නැවත ගොඩ නැගීමක් අපේක්ෂා කෙරේ.

මෙවැනි ගැඹුරු සමාජ-ආර්ථික හා සංසකෘතික විපරීතකරණයක් ජනසවිය ක්‍රියාදමයේ සහභාගි වන්නන්ගේ චින්තනයන් තුළ ගොඩ නැංවීම සුළුපටු කාර්යයක් නොවේ. පසුගිය වකවානුවල ලැබූ අත්දැකීම් අනුව ජනසවියේ පරමාර්ථ ඉටු කර ගැනීමට රජය මගින් යුහුසුළුව විසඳිය යුතු ඉතා බැරෑරුම් සංවර්ධන ප්‍රශ්නය මෙයම විය හැක. මෙය විසඳීම ලෙහෙසි පහසු නොවන නමුත් සමස් ථයක් වශයෙන් එම කැපවීම හා ස්ථිර අධිෂ්ඨානය ලබා ගැනීමට දේශපාලන හා පරිපාලන ක්ෂේත්‍රයේ නියුතු අය නීති රීති මගින් පාලනය කරන අතරම, ඔවුන්ගේ අවශ්‍යතා හා බලාපොරොත්තු ඉටුකර දීම හා කාර්යක්ෂම තාවයට සරිලන දිරිගැන්වීම් ද ලබාදීමෙන් ධෛර්යමත් කිරීමක්ද අවශ්‍ය වන්නේය.

සංකීර්ණ දර්ශණයක් තුළින් රටෙහි ආර්ථික හා සමාජ වශයෙන් ඉතා දුබලව ඇති ජනකොටස් සංවර්ධන මාර්ගයට ඇතුලත් කිරීමට ජනසවිය මගින් දරණ තැත, නිදහස ලැබූද පටන් ලක්දිව ඉදිරිපත් කරන ලද නොයෙක් වටිනා දර්ශන, ප්‍රතිපත්ති හා සැළසුම් වලට මුහුණ පාන්නට වූ දුශ්කරතාව යන්ට ලක් නොවෙන්නට වග බලා ගැනීම සැමගේ යුතුකමකි. මන්ද, එවැනි පරිහානියකට පසු ලක්දිව සංවර්ධන පරිනාමයේ ඊළග අවස්ථාව, විය හැක්කේ ශතවර්ෂ ගණනාවක් තුළ ගොඩනැගුණු ආර්ථික සමාජීය ව්‍යුහය සහමුලින්ම බිඳ වැටීමකි.

□